# G.C.E. ORDINARY LEVEL

## අ.පො.ස. සාමාන්‍ය පෙළ

**STUDENT SEMINAR SERIES - 2017**

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2017

# HISTORY

## ඉතිහාසය

# QUESTION PAPER - II

## ප්‍රශ්න පත්‍රය - II



**Powered by**

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ඉ-ඉගෙනුම් හා නැණසස අධ්‍යාපනික වැඩසටහන් ඒකකය**
**අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය**
**උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2017**

# ඉතිහාසය - II පත්‍රය

| 11 ශ්‍රේණිය | සිංහල මාධ්‍යය | කාලය - පැ. 3 |
|---|---|---|

- I කොටසේ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කැලණි ගග, ඌරුවෙල, රාවණා ඇල්ල, ගගසිරිපුර, දඹදෙණිය, නකදිව, ගෝකණ්ණ, පරාක්‍රම සමුද්‍රය, රංචාමඩම, චේතියගිරිය, දේවනගර, මිනිපේ අමුණ

(ලකුණු 12යි)

(ii) ප්ලෝරන්ස්, සූවස් ඇල, ගෝව, මලක්කා සමුද්‍ර සන්ධිය, තායිලන්තය, හිරෝෂිමා

(ලකුණු 06යි)

(ආ) (i) පහත A , B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන් දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A- ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට මහවැලි ඉදිකිරීමේ පුරෝගාමී පාලකයා
B- දෙවන ලෝක සංග්‍රාමයේ දී කොන්දේසි විරහිත ව පරාජය පිළිගත් ජපන් අධිරාජ්‍යයා
C- රයිගම වීර අලකේෂ්වර ජීවග්‍රහයෙන් චීනයට ගෙනගිය චීන සෙන්පතියා
D- "මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇතැයි" ප්‍රකාශ කළ විප්ලවීය නායකයා

(ලකුණු 04යි)

■ A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. A පින්තූරයේ දැක්වෙන ස්ථානය කුමක් ද?
2. මෙය පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයේ ද?
3. මෙයින් තොරතුරු හෙළිවන්නේ කුමන යුගයක් පිළිබඳව ද?
4. මෙය අයත් වන්නේ ලංකාවේ කිනම් දේශගුණික කලාපයකට ද?


A

(ලකුණු 04යි)

(iii) 1. B රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. ඔහු නියෝජනය කරන ලද රාජ්‍යය නම් කරන්න.
3. මොහුගේ මූලිකත්වයෙන් බිහි වූ ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?
4. ලෝක සංග්‍රාමයේ දී මොහු නියෝජනය කරන ලද්දේ කුමන පාර්ශවය ද?

(ලකුණු 04යි)



B

## II කොටස

2. (i) පහත මූලාශ්‍රවලට අදාළ උදාහරණය බැගින් ලියා දක්වන්න.

A- ප්‍රශස්ති කාව්‍යය
B- පෘතුගීසි මූලාශ්‍රය
C- චීන මූලාශ්‍රය

(ලකුණු 03යි)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ තෙත් කලාපීය ගල්ගුහා දෙකක් නම් කරන්න.

(ලකුණු 04යි)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවන රටාව කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයා සතුව දියුණු තාක්ෂණයක් පැවති බවට කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 06යි)

3. (i) පහත සඳහන් රජවරු භාවිත කරන ලද රාජ්‍යත්ව සංකල්ප දී ඇති වරහන් තුළින් තෝරා A, B, C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A- I කාශ්‍යප
B- කුඨකණ්ණ අභය
C- කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල

( නරඉසෙර, වීරත්ව , චක්‍රවර්තී , පර්වතරාජ, දේවත්ව , බෝධිසත්ත්ව ) (ලකුණු 03යි)

(ii) අනුරාධපුර යුගයේ දී රාජ්‍යත්ව උරුම වූ පහත සඳහන් ආකාරවලට උදාහරණ දෙක බැගින් ලියන්න.

A- පියාගෙන් පුතාට
B- සහෝදරයාගෙන් සහෝදරයාට (ලකුණු 04යි)

(iii) දුටුගැමුණු රජතුමාගේ දේශපාලන හා ආගමික සේවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(iv) පළමු විජයබාහු රජු තම පාලන මධ්‍යස්ථානය පොළොන්නරුවට මාරුකිරීම කෙරෙහි බලපෑ හේතු සාධක තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06යි)

4. (i) රටක පාලනය මෙහෙයවන පහත සඳහන් ආයතන සතු ප්‍රධාන කාර්යය නම් කරන්න.

A- ව්‍යවස්ථාදායකය
B- විධායකය
C- අධිකරණය (ලකුණු 03යි)

(ii) පහත A, B, C හා D යටතේ දක්වා ඇති කාර්යය හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේ

B- පොළොන්නරුවේ දළදා මාලිගාවේ ආරක්ෂාව වේළෙක්කාර හමුදාවට පැවරූ රජතුමා

C- රෝම දේශයට දූතයන් යවා වීදුරු පබළු ගෙන්වා ගත් රජතුමා

D- පළමු පරාක්‍රමබාහු රජු උපන් ස්ථානයේ ඉදිකළ චෛත්‍යය

(ලකුණු 04යි)

(iii) අතීත වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 05යි)

(iv) අතීත ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය උදාහරණ තුනක් මගින් විස්තර කරන්න.
(ලකුණු 06යි)

5. (i) යාපනය රාජධානිය පිළිබඳව හැදෑරීමට ඇති මූලාශ්‍ර තුනක් නම් කරන්න.
(ලකුණු 03යි)

(ii) ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයට අයත් රාජධානි දෙකක් හා දෙවන නාගරීකරණයට අයත් රාජධානි දෙකක් නම් කරන්න.
(ලකුණු 04යි)

(iii) දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ දී සිදු වූ දේශපාලන හා සංස්කෘතික සේවාවන් දෙකක් විස්තර කරන්න.
(ලකුණු 05යි)

(iv) රාජධානි නිරිත දෙසට විතැන් වීමත් සමග ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න.
(ලකුණු 06යි)

6. (i) පහත A, B, C යටතේ දක්වා ඇති ඓතිහාසික සිදුවීම්වලට අදාළ පුද්ගලයින් සඳහන් කරන්න.

A- ක්‍රි.ව.1505 දී මෙරටට පැමිණි පළමු පෘතුගීසි ජාතිකයා

B- ක්‍රි.ව.1602 දී මෙරටට පැමිණි පළමු ලන්දේසී ජාතිකයා

C- ක්‍රි.ව.1762 දී මෙරටට පැමිණි පළමු ඉංග්‍රීසි ජාතිකයා (ලකුණු 03යි)

(ii) දෙවන රාජසිංහ රජු මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 04යි)

(iii) පළමු විමලධර්මසූරිය රජුගෙන් සිදු වූ දේශපාලන හා සංස්කෘතික සේවාව බැගින් විස්තර කරන්න.
(ලකුණු 05යි)

(iv) උඩරට රාජධානි සමයේ පැවති ආර්ථික හා සමාජයීය ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 06යි)

7. (i) පහත A, B, C හි සඳහන් ප්‍රතිසංස්කරණ කිනම් ආණ්ඩුක්‍රම යටතේ ක්‍රියාත්මක වූයේ දැයි දක්වන්න.

A- ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.

B- සර්වජන ඡන්ද බලය හඳුන්වා දීම.

C- ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව ඇති කිරීම. (ලකුණු 03යි)

(ii) ක්‍රි.ව.1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපතිවරයා සතු බලතල හතරක් නම් කරන්න. (ලකුණු 04යි)

(iii) ක්‍රි.ව.1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අරමුණු තුනක් පැහැදිලි කරන්න.
(ලකුණු 06යි)

## III කොටස

8. (i) බ්‍රිතාන්‍යයෙන් පසු යුරෝපයේ කාර්මික විප්ලවය ක්‍රියාත්මක වූ රටවල් 03ක් නම් කරන්න. (ලකුණු 03යි)

(ii) කාර්මික විප්ලවයෙන් පහත සොයාගැනීම් සිදුකළ පුද්ගලයින් පහත දී ඇති පිළිතුරු අතරින් තෝරා නම් කරන්න.

A- ආරක්ෂක ලාම්පුව
B- වාෂ්ප බලයෙන් ක්‍රියාකරන මියුල් යන්ත්‍රය
C- යපස් උණු කිරීමේ විදුලි උඳුන
D- යකඩවල ඇති අපද්‍රව්‍ය ඉවත් කර වානේ නිපදවිය හැකි යන්ත්‍රයක් නිපදවීම

( හෙන්රි බෙසමර්, රිචඩ් ආක්රයිට්, සැමුවෙල් ක්‍රොම්ප්ටන්, හම්පිඩේවි, විලියම් සීමන්ස් )

(ලකුණු 04යි)

(iii) කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කළ බලපෑම කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 05යි)

(iv) කාර්මික විප්ලවය නිසා ඇති වූ ආර්ථික හා සමාජයීය වෙනස්කම් කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න.
(ලකුණු 06යි)

9. (i) පහත A,B,C යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු ලියන්න.

A- ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ පුරෝගාමියා
B- ඇමරිකා එක්සත් ජනපදය පළමු ලෝක යුද්ධයේ දී මිත්‍ර පිලට එක් වීමට හේතුව
C- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන විධායක තනතුර

(ලකුණු 03යි)

(ii) පළමු ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ
A- මිත්‍ර පිලේ රටවල් දෙකක් ද

දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ
B - අක්ෂ පිලේ රටවල් දෙකක් ද ලියා දක්වන්න.

(ලකුණු 04යි)

(iii) දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

(iv) වර්තමානයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලෝක සාමය රැකීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග තුනක් පහදන්න.
(ලකුණු 06යි)


ඉන්ටනෙට් සෙල්ලං
දිනක වේදෝ ලෙල්ලන්
නැණවත් අන්තර්ජාල භාවිතය ඔබේ වගකීමකි. ඒ සඳහා හැමවිට වැඩිහිටි මග පෙන්වීම ලබාගන්න
Dialog
තිරසාරත්ව අංශයේ පණිවිඩයකි